ISBN 978- 955-4563- 71- 1

# අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව සහ ඔවුන් පත්කළ යුතු ආකාරය (භාරතයේ සහ ශ්‍රී ලංකාවේ අමාත්‍ය මණ්ඩලය අතර සංසන්දනාත්මක අධ්‍යයනයක්)

**පී.එම්.යූ.ප්‍රේමරත්න**
**ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය**

**සංක්ෂෙපය**

***පාලන ක්‍රමය ගත්විට ලංකාවට මුල් අවධියේ සිට ම ඉන්දීය බලපෑම් ඒ කෙරෙහි ඇති විය. විජය ඇතුළු පිරිස උතුරු ඉන්දියාවේ පැවති පාලන ක්‍රමය ලංකාවට ගෙන එන ලදී. ඒ අනුව ලංකා ඉතිහාසයේ මුල් රාජ්‍ය පරිපාලන ක්‍රම උතුරු ඉන්දියානු ක්‍රමයට හැඩගැසුණු ඒවා ය. ඒ අනුව අමාත්‍ය මණ්ඩලය සකස්වීම කෙරෙහි ද ඉන්දියාවේ පැවති මූලධර්ම බලපාන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. එසේ මෙරට අමාත්‍ය මණ්ඩලය සකස්වීම කෙරෙහි ඉන්දීය මූලධර්ම බලපෑවේ ද නැද්ද යන්න විමර්ශනය කිරීම මෙම ලිපිය තුළින් සිදුකෙරේ. එහිදී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කෙරිණි.***

හැඳින්වීම

භාරතයේ වුව ද පැරණි ශ්‍රී ලංකාවේ වුව ද පාලන තන්ත්‍රය තුළ අමාත්‍ය මණ්ඩලයට සුවිශේෂී ස්ථානයක් හිමි විය. එමෙන් ම දෙරටේ පැවති අමාත්‍ය මණ්ඩල දෙක අතර සාම්‍යතා ද දිස්වේ. එහෙයින් අමාත්‍ය මණ්ඩලය සකස්වීම කෙරෙහි භාරත බලපෑම පැවති බව උපකල්පනය කළ හැකි ය. වෙසෙසින් ම ලංකාවට බුදුදහම ලැබුණේ ද, ලේඛන කලාව ලැබුණේ ද භාරතයෙනි. ලංකාවේ පිහිටීම අනුව භාරත බලපෑම පැවති අතර එහෙයින් ම පාලන සංවිධානය සකස්වීම කෙරෙහි ත් භාරත බලපෑම ලැබෙන්නට ඇත. නමුත් අමාත්‍ය මණ්ඩලය සම්බන්ධයෙන් මෙතෙක් ලැබී ඇති තොරතුරු විමර්ශනය කිරීමේදී රාජත්වය සම්බන්ධයෙන් ලැබුණු බලපෑමට වඩා අඩු බලපෑමක් ඒ සඳහා ලැබුණු බව පෙනේ. කෙසේ වෙතත් ලංකාවේ රාජත්වය ප්‍රතිෂ්ඨාපිත වූ දිනයන්හි ම පාහේ අමාත්‍ය පදවියේ ද ප්‍රභවය සිදුවූ බවට සැකයක් නොමැත. මෙම පදවිය පාරම්පරික වූවක් නොවුණ ද අමාත්‍ය පදවියට පුද්ගලයන් තෝරා පත්කර ගන්නා ලද්දේ කුලීනයන් අතුරෙනි. රාජ්‍ය පාලනයේ සුවිශාල මෙන් ම සංකීර්ණ කාර්යභාරය රජුට තනි ව ගෙනයාමට නොහැකි හෙයින් අමාත්‍ය මණ්ඩලයේ සහාය ලබාගත් බව පෙන්වාදිය හැකි ය.

**අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව සම්බන්ධයෙන් භාරතයේ ගුරුකුල අතර පැවති මතවාද**

භාරතීය දේශපාලන න්‍යාය ග්‍රන්ථ විමර්ශනශීලී ව අධ්‍යයනය කිරීමේදී පෙනී යන්නේ අමාත්‍ය මණ්ඩලයේ නැතහොත් මන්ත්‍රී පර්ෂදයේ සංඛ්‍යාව පිළිබඳ ව විවිධ ගුරුකුල අතර මතභේද පැවති බව යි. මනු සඳහන් කරන්නේ අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව හතක් හෝ අටක් විය යුතු බව යි (*මනුස්මෘතිය හා මානව ශිෂ්ටාචාරය*, 2001). ඔවුන් ද වංශ පරම්පරාවෙන් පැමිණි, ශාස්ත්‍රය දත්, ශූර, ඉලක්කයේ දක්ෂ, මනා කුලයක උපන්, සුපරීක්ෂාකාරී ඇමතිවරු විය යුතු බව දක්වයි.

**"මෞලාඤ්ඡාස්ත්‍රවිදඃ ශුරාංල්ලබ්ධලක්ෂාන් කුලෝද්භවාන්**
**සචිවාන් සප්ත චාෂ්ටෞ වා ප්‍රකුර්වීත පරික්ෂිතාන්"**

(*මනුස්මෘතිය හා මානව ශිෂ්ටාචාරය*, 2001)

මොවුන් අතරින් එක් බ්‍රාහ්මණයෙකු ඇමති පදවියට පත් කළ යුතු යි (*මනුස්මෘතිය හා මානව ශිෂ්ටාචාරය*, 2001). එසේ ම මනුගේ අදහසට අනුව ඇමතිවරු අතර ඉතා ම සැලකිය යුත්තා උගත් බ්‍රාහ්මණයා ය. මහාභාරතයේ ද රජු සෑම විටෙක ම බ්‍රාහ්මණ ශ්‍රේෂ්ඨයාගේ උපදෙස් ගත යුතු බව දැක්වේ (*මහාභාරතය*, 2006). කෙසේ වෙතත් රජු අවසාන තීරණයකට එළඹීමේදී බ්‍රාහ්මණයා සමග සාකච්ඡා කළ යුතු බව මනුගේ අදහස යි.

**"සර්වේෂාං තු විශිෂ්ටේන බ්‍රාහ්මණේන විපශ්චිතා**
**මන්ත්‍රයේත් පරමං මන්ත්‍රං රාජා ෂාඩ්ගුණ්‍යසංයුතම්**
**නිත්‍යං තස්මින් සමාශ්වස්තඃ සර්වකාර්යාණි නික්ෂිපේත්**
**තේන සාර්ධං විනිශ්චිත්‍ය තතඃ කර්ම සමාරභේත්"**

(*මනුස්මෘතිය හා මානව ශිෂ්ටාචාරය*, 2001)

ඒ අනුව රාජ්‍යයේ යහපත උදෙසා දක්ෂ වූ යහපත් අමාත්‍ය මණ්ඩලයක් පත් කරගැනීමේ වැදගත්කම මනු පෙන්වා දී තිබේ. සාමාජික ව්‍යවස්ථාවට ප්‍රධානත්වය දෙමින් විවිධ කාර්යයන්ට අනුරූප ව ත්‍යාගී ජීවිතයක් ගෙවන, උගත්, චින්තනශීලී, පුද්ගලයන් අමාත්‍ය තත්ත්වයට පත් කරන ආකාරය මනු විසින් පෙන්වා දී ඇති අතර රාජ්‍යයේ යහපත උදෙසා දක්ෂ, යහපත් අමාත්‍ය මණ්ඩලයක් පත් කරගැනීමේ සුවිශේෂීතාව මනු තවදුරටත් පෙන්වා දේ (*මනුස්මෘතිය හා මානව ශිෂ්ටාචාරය*, 2001). සැබැවින් ම රාජ්‍යයේ ආරක්ෂාව උදෙසා අමාත්‍යවරු පත් කරගත යුතු අතර එක් එක් කාර්යයන්ට සුදුසු පරිදි, උත්සාහවත් වූ, අලසකමින් තොර වූ, දක්ෂ පුද්ගලයන් අමාත්‍ය මණ්ඩලයට තෝරාගත යුතු බව මනුගේ අදහස යි.

**ISBN 978- 955-4563- 71- 1**

ජාතකට්ඨ කථාවන් ගෙන බැලූ කල ඒවායේ අමාත්‍යවරු දහදාහ, අසූදාහ ආදී සංඛ්‍යාවන්ගෙන් සමන්විත වන බව කියවෙන අතර (*ජාතකට්ඨකථා*, 2007) මේවායේ අතිශයෝක්ති ද ගැබ් ව ඇති බව පෙනේ. මෙම තත්ත්වය පැරණි ශ්‍රී ලංකාවේ අමාත්‍ය මණ්ඩලය සම්බන්ධයෙන් දේශීය මූලාශ්‍රයේ ද දක්නට ලැබේ. එනම්, පළමුවන පරාක්‍රමබාහු රාජ්‍ය කාලය සම්බන්ධයෙන් මූලාශ්‍රයේ එන තොරතුරුවල,

**"විරිදු ලා සිටින නවලක්ෂ සයානුදහසක් පමණ**
**ඇමති මහ සෙනග...."**

(*රාජරත්නාකරය*, 1990)

යනුවෙන් එන සඳහන ඊට මනා නිදර්ශනයකි. නමුත් අතිශයෝක්තිය බැහැර ලූ කල මේවායේ යම්කිසි ඓතිහාසික සත්‍යතාවක් තිබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

බෘහස්පතිට අනුව අමාත්‍ය මණ්ඩලය දහසය දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර (*Kautalîyãrthasãstrasangraha and The nîtisûthras of Brihaspathi Chanakya and somadeva*, 1957) උශනස් හෙවත් ඖෂනාසගේ අදහස එය විස්සක් විය යුතු බව යැයි කෞටිල්‍ය පෙන්වා දේ (*කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය*, 2003). ශුක්‍ර නීතිසාරයේ පෙන්වා දෙන්නේ අමාත්‍යවරු දස දෙනෙක්වත් සිටිය යුතු බව යි.

**"පුරෝධා ච ප්‍රතිනිධිඃ ප්‍රධාන සචිවස්තථා**
**මංත්‍රී ච ප්‍රාඞ්විවාකශ් ච පණ්ඩිතශ් ච සුමන්ත්‍ර ක**
**අමාත්‍යොදූත ඉත්‍යෙතාරාශ්‍ඥඃ ප්‍රකෘතයො දශ"**

(*Ŝhukra Nîthiŝara*, 1915)

එහෙත් ශුක්‍ර අමාත්‍යවරු හතක් අටක් වුව ප්‍රමාණවත් බව දක්වයි. යම් ලෙසක කිසිදු මනුෂ්‍යයෙකුට අත්, කන්, ඇස් ආදී ඉන්ද්‍රියයන්ගෙන් තොර ව කටයුතු කිරීමට නොහැකිවාක් මෙන් ම අමාත්‍යවරුන්ගෙන් තොර රජුගේ පැවැත්ම අතිශයින් ශෝචනීය තත්ත්වයක් ගන්නා බව ඔහු තවදුරටත් පෙන්වා දේ.

**"බාහුකර්ණාක්ෂිහීනඃ ස්‍යාද්විනාතාභ්‍යාමතොනෘප**
**යොජයොංච්චිතයිත්වාතෞමහානාශය චාන්‍යථා"**

(*Ŝhukra Nîthiŝara*, 1915)

කෙසේ වෙතත් ශුක්‍ර පෙන්වා දෙන අමාත්‍ය මණ්ඩලයට, පුරෝහිත, ප්‍රතිනිධි, ප්‍රධාන, සචිව, මන්ත්‍රීන්, ප්‍රාඞ්විවාක, පණ්ඩිත, සුමන්ත්‍ර, අමාත්‍ය, දූත යන අටදෙනා අයත් වේ (*Ŝhukra Nîthiŝara*, 1915). පැරණි ශ්‍රී ලංකාවේ අමාත්‍ය මණ්ඩලය තුළ මෙම නමින් ම අමාත්‍යවරු නොසිටිය ද උක්ත කී අමාත්‍යවරුන්ගේ කාර්යයන්ට සමාන කාර්යයන් ඔවුන්ට ද පැවරී තිබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

ශුක්‍ර නීතිසාරයේ එන ඇතැම් අමාත්‍යවරුන්ට භාර වූ කටයුතු පිළිබඳ විමර්ශනය කිරීමේදී ඒ බව පැහැදිලි වේ. ශුක්‍ර දක්වන පරිදි අමාත්‍ය මණ්ඩලයේ පළමුවැන්නා පුරෝහිත ය. පුරෝහිත යනුවෙන් අදහස් කරන ලද්දේ වෛදික යුගයේදී පවා රත්නීන් අතර ප්‍රධාන ස්ථානය ගත් රජුගේ ආගමික කටයුතු භාර පුද්ගලයා ය. ඔහු රජුගේ ආධ්‍යාත්මික ගුරුවරයා වශයෙන් ද සැලකිණි (*Ŝhukra Nîthiŝara*, 1915). වෙසෙසින් ම පුරෝහිත වූ කලී සිය ඉන්ද්‍රජාලික බලය යොදාගෙන රාජ්‍යය සතුරන්ගෙන් ආරක්ෂා කරන්නෙකි. යුද්ධයේදී රජතුමා ව ආරක්ෂා කිරීම මෙන් ම රජු සමග යුද්ධයේදී එක් ව ගමන් කිරීම මොහුට පැවරුණ කාර්යයන් ය. එමෙන් ම නීති ශාස්ත්‍රය හා අවි ආයුධ පිළිබඳ දන්නා තැනැත්තා පුරෝහිතයා ය.

**"නීතිශාස්ත්‍රාස්ත්‍රව්‍යුහාදී කුශලස්තු පුරෝහිතඃ"**

(*Ŝhukra Nîthiŝara*, 1915)

මෙම මූලධර්මයන්හි ආභාසය ලක්දිවට ලැබුණේදැ යි නිශ්චිත ව කිව නොහැකි වුව ද මෙවැනි තත්ත්වයක් පුරාණ ශ්‍රී ලංකාවේ ද පැවති බවට සාධක ලැබේ. එනම්, පණ්ඩුකාභය කුමරු ස්වර්ණපාලිය රැගෙන පලා ගිය අවස්ථාවේ කුමරියගේ පිය රජු විසින් එවන ලද ඇයගේ පස්බෑයෝ සමග යුද කොට ඔවුන් සියල්ලන් ම මැරුවේ පණ්ඩුල බ්‍රාහ්මණයාගේ පුත් වූ චන්ද්‍ර කුමරා යි (*මහාවංසය*, 1994). මේවායින් පැහැදිලි වන්නේ පුරෝහිතයා ශස්ත්‍ර (අවිශිල්පය), හා ශාස්ත්‍ර (වේදය) යන විෂයයන් දෙකෙහි ම ප්‍රවීනත්වයක් ලැබූවෙක් බව යි.

රජු විශාල යාග හෝ වෙනත් අවශ්‍යතා සඳහා රාජ්‍ය පරිපාලනයෙන් බැහැර ව සිටින විට රජු නියෝජනය කළේ ද පුරෝහිතයා යි. ලංකාව ගත් කල විජය රජුගේ මරණයෙන් අනතුරු ව පණ්ඩුවාසුදේවගේ පැමිණීම තෙක් රජු වෙනුවෙන් පරිපාලන කටයුතු ගෙනයන ලද්දේ උපතිස්ස

**ISBN 978- 955-4563- 71- 1**

පුරෝහිතයා යි (*මහාවංසය*, 1994). මෙසේ පුරෝහිතයාගේ බලවත්කමට හේතු වන්නට ඇත්තේ රජු කෙරෙහි ඔහුට පැතිරවීමට හැකි ව තිබූ ආධ්‍යාත්මික බලය වන්නට ඇත.

ශුක්‍ර නීතිසාරයට අනුව අමාත්‍ය මණ්ඩලයේ දෙවැන්නා ප්‍රතිනිධි ය. රජු රෝගී වූ විට හෝ යුද කටයුත්තකට බැහැර ව සිටි අවස්ථාවල ප්‍රතිනිධිටත් රජු නියෝජනය කිරීමේ අයිතිය ලැබිණි. හිත අහිත මනා ව දන්නා මොහු යහපත් අයහපත් දේ වෙනත් අයගේ මාර්ගයෙන් රජුට දන්වයි.

**"කාර්‍යාකාර්‍ය ප්‍රවඥාතා ස්මෘතඃ ප්‍රතිනිධිස්තු සඃ"**

(*Ŝhukra Nîthiŝara*, 1915)

පසුකාලයේ මෙම තත්ත්වය ලැබුණේ ඔටුන්න හිමි කුමාරයාට ය. මෙම ප්‍රතිනිධිට සමාන කාර්යභාරයක් ලංකාවේ උපරාජ නැතහොත් යුවරාජ අතින් ඉටුවන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. පනාකඩුව තඹ සන්නස (*Epigraphia Zeylanica*, 1941), දොරටියාව සන්නස (*Inscriptions of Ceylon*, 1970), කඳවුරු සිරිත (*දඹදෙණි අස්න හා කඳවුරු සිරිත*, 1997) යනාදී මූලාශ්‍රයන්ගෙන් යුවරජු පිළිබඳ තොරතුරු හෙළිදරව් වේ. මේ ආකාරයෙන් අනෙක් අමාත්‍යවරුන්ටත් විවිධ වගකීම් පැවරුණි. අනෙක් දේශපාලන න්‍යායාචාරීන් ද මෙම අදහස්වලට එකඟ වී ඇති බවට සාධක ලැබේ. කෙසේ වෙතත් මෙම න්‍යායයන් ශ්‍රී ලාංකේය භූමියට, සදාචාරයට, සංස්කෘතියට සරිලන පරිදි සකස්වන්නට ඇතැයි සිතිය හැකි ය.

ආචාර්ය භීෂ්ම සඳහන් කරන්නේ වේද විද්‍යාව උගත්, නිර්භීත බ්‍රාහ්මණයන් හතර දෙනෙකුත්, නිරෝගීමත් ආයුධධාරී ක්ෂත්‍රියන් අට දෙනෙකුත්, ධන ධාන්‍යයෙන් පිරිපුන් වෛශ්‍යයන් එකොළොස් දෙනෙකුත්, යහපත් පැවතුම් ඇති පිවිතුරු චරිතයෙන් යුත් ශුද්‍රයන් තිදෙනෙකුත්, අට වැදෑරුම් ගුණ දන්නා පුරාවිද්‍යාව දත්, එක් සූත ජාතිකයෙකුත් අමාත්‍ය මණ්ඩලයට යොදාගත යුතු බව යි.

**"පඤ්චාශද්වර්ෂීවයසං ප්‍රගල්බ මනසූයකම්**
**ශ්‍රැතිස්මෘති සමායුක්තං විනීතං විනීතං සමදර්ශිනම්**
**කාර්යෙ විවදමානානාං ශක්තමර්ථෙෂ්වලොලුපම්**
**වර්ජිතං චෛව ව්‍යසනෛඃ සුධාරෛඃ සපතහීභෘශම්**
**අෂ්ටානාං මන්ත්‍රිණාං මධ්‍යෙ මන්ත්‍ර රාජොපධාරයේත්"**

(*මහාභාරතය*, 2006)

මෙය සියුම් ව විමර්ශනය කර බැලීමේදී පෙනී යන්නේ පුරාණ භාරතයේ පැවති ප්‍රධාන කුල සතර ම මෙයින් නියෝජනය වූ බව යි. ඒ අනුව කුලීනයන්ට ම නොව, ඇතැම් අවස්ථාවන්හි කුල හීන අයට ද අමාත්‍ය තත්ත්වයට පත්වන්නට ඉඩ තිබූ බව පෙනේ. නමුත් මෙම තත්ත්වය ඉතා විරල වන්නට ඇතැයි සිතීම සාධාරණ යැයි හැඟේ. කෞටිල්‍ය මේ සියලු ම චින්තකයන්ට වඩා දූරදර්ශී අදහසක් ඉදිරිපත් කරයි. එනම්, කෞටිල්‍ය අදහස් කරන්නේ රජු සිය දේශයේ ප්‍රමාණය සහ එහි අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් අමාත්‍ය මණ්ඩලය තෝරාගත යුතු බව යි.

**"යථාසාමාර්ථ්‍යමිති කෞටිල්‍යඃ"**

(*කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය*, 2003)

නමුත් ස්වකීය අමාත්‍ය සංඛ්‍යාව කෙතෙක්දැ යි යනුවෙන් සතුරා ප්‍රශ්න කළ ද එය සතුරාට හෙළි නොකළ යුතු බව කෞටිල්‍යගේ අදහස යි.

**"පරෙණ චොක්තඃ ස්වාසාං ප්‍රකෘතිනාං ප්‍රමාණං නා චක්ෂිත"**

(*කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය*, 2003)

මේ අනුව අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව සම්බන්ධයෙන් විවිධ ගුරුකුල අතර එක් එක් මත පවතින අතර මෙසේ එක් එක් සංඛ්‍යා ඉදිරිපත් කර තිබුණ ද කෞටිල්‍ය දක්වා ඇති මතය වඩා දූරදර්ශී බව පෙනේ. මෙම න්‍යාය ඕනෑ ම රාජ්‍යයකට පොදුවේ පිළිගත හැකි නිසාවෙන් මෙය වඩා ප්‍රායෝගික බව කිව හැකි ය. පැරණි ශ්‍රී ලාංකේය පාලකයන් ද මෙම න්‍යාය ධර්මය ගරු කළා විය යුතු ය. එයට හේතුව එය මෙතෙක් යැයි නිශ්චිත ව දක්වන සඳහන් අනාවරණය නොවන බැවිනි. ඒ අනුව කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයේ ද සඳහන් වන පරිදි අවශ්‍යතාවට අනුකූල ව පැරණි ශ්‍රී ලාංකේය නරපතියන් ද අමාත්‍ය මණ්ඩලය තෝරා පත්කර ගන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

විජයට අමාත්‍යවරුන් පස් දෙනෙක්වත් සිටියහ (*මහාවංසය*, 1994). මේ අය අතරෙන් එක් අයෙක් විජය රජුගේ අනුශාසකයා හෙවත් පුරෝහිතයා වූයේ ය (*මහාවංසය*, 1994). මෙම අමාත්‍යවරු පණ්ඩුවාසුදේව රජවීමට පෙර පැවති අරාජක අවධියෙහිදී රට කරවූහ (*මහාවංසය*, 1994). දේවානම්පියතිස්ස රජුට මහාරිට්ඨ නමින් මහාමාත්‍යවරයෙක් සිටියේ ය (*මහාවංසය*, 1994). දුට්ඨගාමිණී රජුට තිස්ස නම් අමාත්‍යයෙක් සිටියේ ය (*මහාවංසය*, 1994). ඔහුගේ අමාත්‍යවරුන් සහ සෙනෙවිවරුන් දෙකොටසකට ගැනේ (*ලංකා ඉතිහාසය*, 1967). පිටුවහල් ව සිටි අවධියෙහිදී වට්ඨගාමිණී අභය රජුට අමාත්‍යවරු අටදෙනෙක් සිටියේ ය (*මහාවංසය*, 1994). තිස්සාරාමය නැතහොත් උත්තර තිස්සාරාමය පිහිටුවූයේ මොවුන් අතරේ සිටි තිස්ස නමැති අමාත්‍යා යි (*මහාවංසය*, 1994).

ISBN 978- 955-4563- 71- 1

## නිගමනය

මේ ආකාරයෙන් ලංකා ඉතිහාසය ගත්ත ද එක් එක් කාල පරිච්ඡේදයන්හි රජු තම අවශ්‍යතාවට ගැළපෙන පරිදි අමාත්‍යවරුන් පත් කරගත් බව ත් පාලන තන්ත්‍රය තුළ අමාත්‍ය මණ්ඩලයට සුවිශේෂී ස්ථානයක් හිමි වූ බව ත් පැහැදිලි වේ. මෙය කෞටිල්‍ය පවා අවධාරණය කළ කාරණයකි. දෙරටෙහි ම රාජත්වය ප්‍රතිෂ්ඨාපිත වූ දිනයන්හි ම පාහේ අමාත්‍ය පදවියේ ද ප්‍රභවය සිදුවූ බවට සැකයක් නොමැත. සමස්තයක් වශයෙන් ගත් කල අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව සම්බන්ධයෙන් තොරතුරු විමර්ශනය කිරීමේදී භාරතීය මූලධර්මයන්හි බලපෑම කෙසේ වෙතත් සාම්‍යතා නම් පැවතුණ බව නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

*කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය*, (2003), පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*ජාතකට්ඨකථා, (පළමුවැනි කොටස)*, (2007), (සිංහල පරි.), ඒකක නිපාතය, චන්දකිත්ති හිමි, යාලේගම, දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රකාශනය.

*දඹදෙණි අස්න හා කඳවුරු සිරිත*, (1997), ආනන්ද හිමි, කෝන්ගස්තැන්නේ, තිලක් ප්‍රකාශන.

*මහාභාරතය*, (2006), (පරිවර්තනය), පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*මහාවංසය*, (1994), ශ්‍රී සුමංගල නායක මාහිමි සහ දේවරක්ෂිත පඬිතුමා, බටුවන්තුඩාවේ, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*මනුස්මෘතිය හා මානව ශිෂ්ටාචාරය*, (2001), සෙනෙවිරත්න, ආරියදාස, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*රාජරත්නාකරය*, (1990), (සංස්.), ඤාණිස්සර හිමි, දවුල්දෙණ, කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

*ලංකා ඉතිහාසය*, (1967), කොළඹ, ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩල ප්‍රකාශනය.

*Epigraphia Zeylanica.*,vol.V, (1941), Paranavithana, S., Colombo, Published for the Government of Ceylon.

*Inscriptions of Ceylon*, (1970), vol.I , Paranavithana, S., Published by the Deparment of Archaeology.

*Kautalîyãrthasãstrasangraha and The nîtisûthras of Brihaspathi Chanakya and somadeva*, (1957), Venkataíthacharya, N.S., Govet. Branch Press.

*Ŝhukra Nîthiŝara*, (1915), Sarkar, C.F., New Delhi.